**සිංහල පරිවර්තනය**

උ.ප.රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක 02/2024

මගේ අංකය : NP/07/10/01/176
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
23.01.2023

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයට අයත් මෝටර් වාහන රියදුරු III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයට අයත් මෝටර් වාහන රියදුරු තනතුරට පහත සඳහන් පරිදි දක්නට ලැබෙන තනතුරු පුරප්පාඩු 72කට දිස්ත්‍රික් මට්ටමින් බඳවා ගැනීම සඳහා සීමිත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් 2024 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය 2024.02.22 වේ.

| දිස්ත්‍රික්කය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| යාපනය | 43 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 14 |
| කිලිනොච්චිය | 08 |
| මුලතිව් | 05 |

### 02. බඳවා ගැනීපම් සේවා කොන්දේසීන්

**02.1** 2013.07.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා 2024.01.08 වන දින උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද රියදුරු තනතුරට අදාළ මෙම සේවා ව්‍යාවස්ථාවේ පළමු සංශෝධනය හා මෙහි නිර්දේශිත කොන්දේසීන් වලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට ද, මුදල් රෙගුලාසීන්ට ද අනුකූලව හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතන කාර්ය පටිපාටික සංග්‍රහය යනාදියට අනුකූලව, තෝරාපත් කරනු ලබන විභාග අපේක්ෂකයින් නියමිත ඒකාබද්ධ රියදුරු සේවයට අයත් මෝටර් වාහන රියදුරු III වන ශ්‍රේණියේ තනතුරට සීමිත බඳවා ගැනීම මගින් පත් කරනු ලැබේ.

**02.2** මෙම තරඟ විභාගයෙන් සමත්වන විභාග අපේක්ෂකයන් හට, තම පත්වීමේ දින සිට වසර තුනක වැඩ බැලීමේ පරිවාස කාලයකට යටත් කර පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් නියම කර තිබෙන පරිදි ඒකාබද්ධ රියදුරු සේවයට අයත් මෝටර් වාහන රියදුරු සේවයේ III වන ශ්‍රේණියට පත්කළ දින සිට වසර 03ක් ඉක්මවීමට ප්‍රථමයෙන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුයි.

**02.3** මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි එබැවින් මෙම පත්වීම ලබාගන්නා රියදුරන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසීන්ට යටත් කරනු ලැබේ.

**02.4** එක් සේවා ස්ථානයකට පත්වීම් ලබන රියදුරු, එම සේවා ස්ථානයේ ම අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවයේ යෙදිය යුතුයි යන කොන්දේසිය අනිවාර්යය වන අතර සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන පත්වීම් බලධාරියා විසින් ස්ථාන මාරුවට ලක් කළ හැකිය.

**02.5** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා මෙම චක්‍රලේඛයට අනුකූලව දිගටම නිකුත් වන චක්‍රලේඛ වලට අනුව පත්වීම් දින සිට වසර 03ක් ඉක්මවීමට ප්‍රථමයෙන් සඳහන් කර තිබෙන දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුයි.

**02.6** පත්වීම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක වන දිනය යනාදී කරුණු පත්වීම් බලධාරියා විසින් තීර්ණය කරනු ලැබේ. නිවේදනය කොට තිබෙන පුරප්පාඩු සම්බන්ධයෙන් ඇතැම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතු ය. පත්කිරීමට නියමිත සංඛ්‍යාව 72 කි.

## 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට අනුකූලව වැටුප් කාණ්ඩය **PL 3 – 2016** පරිදි ඒකාබද්ධ රියදුරු සේවයට අදාළ මෝටර් වාහන රියදුරු තනතුරේ III වන ශ්‍රේණියට උපචිත වැටුප් අනුපාතය වනුයේ **රුපියල් 25,790-10x270-10x300 10x330-12x350-38,990/- ක්** වේ. **රුපියල් 26,600/- ක** වැටුප් පියවරට ප්‍රථමයෙන් / පිහිටුවනු ලබන වැටුප් පියවරෙන් 3 වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථමයෙන් **පළමු වන** කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වී සිටිය යුතුයි.

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට අවශ්‍ය කායික
04.3 යෝග්‍යතාවයකින් යුතු අපේක්ෂකයකු විය යුතු අතරම මනා චරිතවත් අපේක්ෂකයකු ද විය යුතුයි.

04.4 අයදුම්කරු විසින් අයදුම්පත්‍රය භාරගන්නා **අවසාන දිනට හෝ ඊට ප්‍රථම මෙම නිවේදනය මඟින් කැඳවා ඇති සියළුම සුදුසුකම්** සපුරා තිබිය යුතුයි.

*04.5* මෙම විභාගය සීමිත තරඟ විභාගයක් බැවින්, බඳවා ගැනීමේ දී වයසි සීමාව අදාළ නොවේ.

**05. අධ්‍යාපන සුදුසුකම් හා සේවා අත්දැකීම් :-**

**(අ) *අධ්‍යාපන සුදුසුකම් :-***

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩිව භාෂාව (දෙමළ / සිංහල) හා කුමක් හෝ විෂයයක් (01) ඇතුළුව විෂයයන් දෙකකට (02) සම්මාන සමඟ විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි. මෙයින් එකවරම අවම වශයෙන් විභාගයෙන් විෂයයන් පහක්(05) සමත්වී තිබිය යුතු යි.

**(ආ) වෘත්තීය සුදුසුකම් :-**

1. මෝටර් වාහන ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් ප්‍රදානය කරන හොන්ඩර 24කට **(CWT)** නොඅඩු ස්ටේෂන් වැගන් වාහන හා පුද්ගලික/කුලී කාර් රථ පැදවීමට අනුමත වූ වලංගු වාහන රියදුරු බලපත්‍ර ලබාගෙන තිබිය යුතුයි.

2. බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවම අවුරුදු 03කට ප්‍රථම

   i. වාහන පන්ති **'C'** හා **'C1'** හිමි වී තිබීම (ලබාගෙන තිබිය යුතුයි).

   **හෝ**

   ii. නව පටිපාටිය යටතේ වාහන පන්ති **'B'** වර්ග පැදවීමට අදාළව වාහන රියදුරු බලපත්‍ර ලබාගෙන තිබිය යුතුයි.

3. මහාමාර්ග නීතී සම්බන්ධයෙන් මනා දැනුමක් හිමිවී තිබිය යුතුයි.

**(ඇ) *සේවා අත්දැකීම් :-***

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට අනුකූලව, මුල් වැටුප් කාණ්ඩය වන **PL 1 – 2016** හෝ **PL 2 – 2016** යටතේ වැටුප් ලබන පළාත් රාජ්‍ය සේවයට අයත් ස්ථිර සේවකයකු විය යුතුයි.

2. උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ස්ථිර තනතුරක් දරණ හා එම තනතුර ස්ථිර කර තිබිය. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර වසර පහක (05) කාලය තුළ දී අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් හිමිවී තිබිය යුතුයි.

**සටහන :**

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 01/2020 දරණ චක්‍රලේඛය, හා ඉන් අනතුරුව අඛණ්ඩව නිකුත් කරන ලද චක්‍රලේඛ යනාදියේ විධිවිධානයන් පරිදි 'විනය අඩුවමක් යටතේ වරදකරුවෙකු නොවී තිබිය යුතුයි' යනුවෙන් හා උතුරු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවය කරන්නෙකු විය යුතුයි ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සනාථ කළ යුතුයි.

2. කිසියම් තනතුරකට ස්ථිර පත්වීමක් ලැබීමට ප්‍රථම සේවය කර තිබෙන හෝ කිසියම් තනතුරකට ස්ථිර කිරීමේ කොන්දේසිය මත සේවය කර තිබීම හෝ පුහුණුවක් ලැබීමට යෙදූ කාල සීමාව යන කරුණු, ඉහත ඡේද 05 (ආ) 02 හි සඳහන් කර තිබෙන සුදුසුකම් ලැබීමේ අවුරුදු පහක කාලසීමාවක් වශයෙන් ගණනය කරනු ලබන්නේ නැත. යම්කිසි තනතුරක ස්ථිරව පත් කිරීමට පෙර තාවකාලික/අනියම් පදනම මත සේවය කර ඇති කාලපරිච්ඡේදය ද ඉහත ඡේද 05 (ආ) 02 හි සඳහන් කර තිබෙන සුදුසුකම් ලැබීමේ අවුරුදු පහක කාලසීමාවක් වශයෙන් ගණනය කරනු ලබන්නේ නැත.

**සැ.යු.**

අයදුම්කරුවන් සියළුදෙනාම තනතුරට අදාළ සියළුම සුදුසුකම් 2024.02.22 වන දිනට හෝ ඊට ප්‍රථමයෙන් සපුරා තිබීම අනිවාර්ය වේ.

(ඇ) **කායික සුදුසුකම් :**

1. අවම වශයෙන් **5** (අඩි) **2.5''** (අඟල්) (158.75cm) උසින් යුතු පුද්ගලයෙකු විය යුතුයි.
2. රාත්‍රි හා දහවල් කාලයේ දී තම සේවය සුදුසු පරිදි සිදු කිරීමට යෝග්‍ය පරිදි මනා ලෙස ඇස් පෙනීම ද නිරෝගී කායික තත්වයක් හා මානසික තත්වයකින් යුතු පුද්ගලයෙකු විය යුතු යි. සම්මුඛ පරීක්ෂණයේ දී රජයේ වෛද්‍ය අධිකාරී විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකය මඟින් මෙම තත්වය ඔප්පු කළ යුතුයි.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 අයදුම්කරුවෙකු, පුරප්පාඩු තිබෙන එක් දිස්ත්‍රික්කයකට පමණක් අයදුම් කිරීමට අනුමත කරනු ලැබේ. අයදුම්කරු තමන් පදිංචි දිස්ත්‍රික්කය කුමක් වුවද තමන් සේවය කිරීමට මනාප දිස්ත්‍රික්කයක් සඳහා අයදුම් කළ හැකි අතරම පත්වීම ලබා ගැනීමට බලාපොරොත්තු වන දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට අනුමත කරනු නොලැබේ.

06.2 අයදුම්කරුවෙකු ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය පදනම් කරගෙන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලැබේ.

06.3 මෙම නිවේදනයේ පළ කර තිබෙන පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂණයට ලක් කරනු ලැබේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කරනු නොලැබේ

06.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සපුරා ඇති බව සනාථ කර ගැනීමෙන් අනතුරුව වෘත්තීය පරීක්ෂණය (Trade Test) සඳහා කැඳවනු ලැබේ.

06.5 වෘත්තීය පරීක්ෂණය (Trade Test) සමත් වූ අපේක්ෂකයන් තමන් අයදුම් කරන ලද දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අනුව, එම දිස්ත්‍රික්කයට අයදුම් කර ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වලින් **පළාතේ ඉහළ ලකුණු අනුපිළිවෙළ(Provincial Merit Order**) මත පත්වීම් සඳහා තෝරාගනු ලැබේ.

## 07. විභාග ගාස්තු :

විභාග ගාස්තු වශයෙන් අයදුම්කරු විසින් රුපියල් **500.00** ක් වටිනා මුදල ''ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත'' යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා, ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නියමිත කොටුව තුළ නොගැළවෙන පරිදි අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබෙන අතර මෙම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා ද ලබාදීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම් කිරීමේ ක්‍රමය :

08.1 මෙම නිවේදනය සමඟ නිකුත් කරනු ලබන අයදුම්පත්‍රය සම්පූර්ණ කර, සම්පූර්ණ කරන ලද එම අයදුම්පත්‍රය 2024.02.22 වන දිනට හෝ ඊට ප්‍රථමයෙන් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48 කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ කාර්යාලයට ගෙනවිත් හෝ අයදුම්පත යොමු කළ යුතු යි.

08.2 අයදුම්පත බහාලන ලිපි කවරයේ වම් උඩු කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයට අයත් මෝටර් වාහන රියදුරු III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය** – 2024" යනුවෙන් සඳහන් කළ යුතුයි.

08.3 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර *පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ* ලේකම් විසින් නිකුත් කරනු ලැබේ විභාග සඳහා ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම මඟින් අයදුම්කරු සියළුම සුදුසුකම් සපුරා ඇති බවට සැළකිල්ලට ගෙන ඇති බව අදහස් නොකරන බව සැළකිල්ලට ගත යුතුයි.

08.4 අයදුම්පත්‍ර යොමුකර ඇති අයදුම්කරුවන් හට විභාග දිනට අවම දින තුනකට (03) ප්‍රථමයෙන් හෝ විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම් ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48 කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දන්වා සිටිය යුතුයි (**දුරකථන අංකය 021 221 9939, ෆැක්ස් අංකය 021 221 9940**)

**සටහන :**

ආවරණ ලිපියක් විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ, නම ජාතික හැඳුනුම්පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, අයදුම්පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා දිනය, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කළ පිටපතක් හා නැවත ප්‍රවේශ පත්‍රයක් යොමු කිරීම සඳහා ෆැක්ෂ් අංකයක්.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ. පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එක් ලේඛනයක් පිළිගනු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුණුම්පත.
(11) වළංගු ගුවන් ගමන් බලපත්‍රය (Pass Port)
(111) වළංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලේඛනවලින් කුමක් හෝ එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවෙකුගේ විභාගයට පෙනී සිටීමේ අයිතිය ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත විසින් අහෝසි කරනු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා, ලේකම්වරයා විසින් නියම කරන නීතිරීති වලට විභාග අපෙක්ෂකයන් නැඹුරුවෙමින් කටයුතු කළ යුතු අතරම එම නීතිරීති උල්ලංඝනය කළ විට පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා, ලේකම්වරයා විසින් පනවන අඩුවමට යටත්වීමට සිදුවේ.

## 10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා නිවැරදි හා සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. මෙම විභාග කොන්දේසීන් වලට අනුකූලව යම්කිසි අපේක්ෂකයෙක් විභාගයට පෙර, හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයට පසුව හෝ කුමක් හෝ අවස්ථාවකදී සුදුසුකම් සපුරා නැති බව අනාවරණය වුවහොත්, එම අයදුම්කරුගේ විභාගයට පෙනී සිටීමේ අයිතිවාසිකම් එම අවස්ථාවේදී ම අහෝසි කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. අයදුම්කරු සපයන ලද තොරතුරු අසත්‍ය බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

## 11 විභාගය සඳහා සැලැස්ම

මෙම විභාගය ලිඛිත පරීක්ෂණය, සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය පරීක්ෂණය යනුවෙන් කොටස් කර ඇති අතර මෙම විභාගය ඉදිරිපත් කරන අයදුම්පත්‍ර වලට අනුකූලව සිංහල හා දෙමළ යන ද්වීභාෂා මාධ්‍යයන් වලින් පැවැත්වීමට නියමිතය. අපෙක්ෂකයන් විසින් විභාගය සඳහා තෝරා ගන්නා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ

### 11.1 ලිඛිත පරීක්ෂණය

මෙම පත්වීමට සුදුසුකම් ලබා ගැනීමට නම් ලිඛිත පරීක්ෂණයට අදාළ එක් එක් ප්‍රශ්න පත්‍ර වලට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුයි. සමස්ත ලකුණු වලින් අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

| අංකය | ප්‍රශ්න පත්‍රය | අන්තර්ගත ප්‍රශ්න | කාලය | සම්පූර්ණ ලකුණු | සමත්වීමට ලබාගත යුතු ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | අංක හා සබැඳි හැකියාව හා තර්කාණුකූලව තීරණ ගැනීමේ හැකියාව උරගා බැලීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න 50ක් මෙම ප්‍රශ්න පත්‍රයට අන්තර්ගක කරනු ලැබේ. | කාලය පැය 01යි | 100 | 40 |
| 02 | භාෂව සඳහා වූ හැකියාව | සාරාංශය ලිවීම තේරුම් ගැනීමේ හැකියාව උච්චාරණය, සමාන පද, විරුද්ධ පද හා ලිපි ලිවීමේ හැකියාව හා ව්‍යාකරණ භාවිතය, යනාදී කරුණු සම්බන්ධ හැකියාවන් පරීක්ෂා කිරීමට සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි | කාලය පැය 1 1/2 යි | 100 | 40 |

### 11.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන විභාග අපෙක්ෂකයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍යා සම්මුඛ පරීක්ෂණයේ දී සපුරා ඇති සුදුසුකම් පරීක්ෂා කරන අතර මේ සඳහා ලකුණු කිසිවක් පිරිනමන්නේ නැත.

### 11.3 වෘත්තීය පරීක්ෂණය :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබා ගන්නා අපේක්ෂකයන් පහත සඳහන් පරිදි වෘත්තීය පරීක්ෂණයට භාජනය කරනු ලැබෙන අතර වෘත්තීය පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇති එක් ඒක විෂය පථයක් සඳහා ම එම විෂයට අවශ්‍ය සාමාර්ථ ලකුණු ලබාගත යුතුයි.

| අංකය | ලකුණු පිරිනමනු ලබන ප්‍රධාන විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සාමාර්ථ ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | වාහන පැදවීමේ හැකියාව | 40 | 20 |
| 02. | මහා මාර්ග හා වීදි සම්බන්ධයෙන් වූ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 03. | මෝටර් රථ සම්බන්ධ කාර්මිකකරණය හා විද්‍යාත්මක දැනුම සම්බන්ධයෙන් මූලික දැනුම | 20 | 10 |
| | **සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** | **100** | **50** |

**සටහන :**

විභාග අපෙක්ෂකයන් වෘත්තිය පරික්ෂණයෙන් සමත් වුව ද පත්වීම සඳහා තෝරා ගන්නා විට ලිඛිත තරග විභාගයෙන් ලබාගත් ඉහළ ලකුණු අනුපිළිවෙළ මත තෝරාගනු ලබන බව දන්වා සිටිනු ලැබේ.

**12 විභාග ප්‍රතිඵල :**

විභාග අපෙක්ෂකයන්ට අදාළ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් **www.np.gov.lk** යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ.

**13** විභාගය පැවැත්වීමට අපේක්ෂා කරන නගර හා එම නගර අංක පහත සඳහන් වේ

| නගර | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිව් | 05 |

එක් නගරයක් වෙනුවෙන් ඉදිරිපත් වෙන අයදුම් පත්‍ර සංඛ්‍යාවන් හි ප්‍රමාණය අවම වූ විට එම නගරයට ආසන්න නගරයේ විභාගය පැවැත්වීමට කටයුතු සැළසීමට ඉඩකඩ ඇත.

**14** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම යන කරුණු සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සතුය. මෙම නිවේදනයේ දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන් අතර යම්කිසි අනනුකූලතාවයක් දක්නට ලැබෙන අවස්ථාවක දී දෙමළ භාෂා මාධ්‍ය නිවේදනයට අනුකූලව කටයුතු සිදු කළ යුතුයි.

**සි. තිරුවාකරන්,**

ලේකම්,

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

උතුරු පළාත.

2024.01.23